# ව්‍යාපාර අධ්‍යයනය

# 12 ශ්‍රේණිය

## නිපුණතාව - 1

### ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# පටුන


| නිපුණතා මට්ටම | පාඩම | පිටු අංකය |
|---|---|---|
| 1.1 | ව්‍යාපාර සංකල්පය විග්‍රහ කරයි. | 3 - 9 |
| 1.2 | ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා අධ්‍යනය කරයි. | 10 - 14 |
| 1.3 | විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කරයි. | 14– 18 |
| 1.4 | ව්‍යාපාර, යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි. | 19 - 22 |
| 1.5 | ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු විමසයි. | 23 - 25 |
| 1.6 | ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරය වර්ග කරයි. | 26 - 27 |
| 1.7 | ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග, ව්‍යපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කිරීම. | 28-29 |
| 1.8 | ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කිරීම. | 30 –31 |
| 1.9 | සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කිරීම. | 32-36 |
| | පුනරීක්ෂණ | 37-38 |



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 1.1 ව්‍යාපාර සංකල්පය හැඳින්වීම

“”ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ සහ සේවා සැපයීම වෙනුවෙන් නිර්මාණය කළ ලාභ අපේක්ෂිත ඕනෑම කටයුත්තක් ව්‍යාපාරයකි. “”

C.L Bovee

- ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන මිනිස් වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු ව්‍යාපාර ලෙස අර්ථ දැක්විය හැකිය.

- ලාභ අරමුණින් තොර ව මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා පවත්වාගෙන යන ව්‍යාපාර ද පවතී.

  උදා - සර්වෝදය සිංහ සමාජයල ලංකා ඔටෝ මොබයිල් සංගමය.

- ඒ අනුව ව්‍යාපාර යනු මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා ඇති ඕනෑම ආර්ථික කටයුත්තකි.



### මානව අවශ්‍යතා/ මිනිස් අවශ්‍යතා

මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු කායික හා මානසික තත්ත්ව මිනිස් අවශ්‍යතා ලෙස හඳුන්වයි.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## වුවමනා

මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හැඳින්වේ.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| ආහාර | බත්, පාන්, ඉඳි ආප්ප, තේ |
| ඇඳුම් | සාරි, කලිසම්, ගවුම්, සරම |
| නිවාස | තට්ටු නිවාස, යුගල නිවාස, නිල නිවාස, නේවාසිකාගාරය |
| අධ්‍යාපනය | පාසල් අධ්‍යාපනය, පිරිවෙන් අධ්‍යාපනය, පෞද්ගලික පාසල් පාඨමාලා, පොත්පත් |
| සෞඛ්‍යය | රජයේ රෝහල්, පෞද්ගලික රෝහල්, බෙහෙත් වෛද්‍ය පරීක්ෂණ |
| සන්නිවේදනය | දුරකථන, ෆැක්ස්, විද්‍යුත් තැපැල, අන්තර්ජාල පහසුකම් |
| ආරක්ෂාව | පොලීසිය, හමුදාව, පෞද්ගලික අංශයේ ආරක්ෂක සේවය |

## අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම්.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| සීමිත වේ. | අසීමිත වේ. |
| සෑම පුද්ගලයෙකුටම පොදුය. | පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වේ. |
| ජීවත් වීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම සුපරාගත යුතු වේ. | ජීවත් වීමට අත්‍යවශ්‍යයෙන්ම සපුරාගත යුතු නොවේ. |
| ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ නොහැකිය | ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකිය. |
| සමාජ බලවේග මගින් වෙනස් කළ නොහැකිය | සමාජ බලවේග මගින් වෙනස් කළ හැකිය. |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිෂ්පාදිතය (Product)

මිනිස් වුවමනා තෘප්තිමත් කරන වෙළෙඳපොලට ඉදිරිපත් කරන ඕනෑම දෙයක් නිෂ්පාදිත ලෙස හඳුන්වයි. මෙම නිෂ්පාදිත වලින් මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගනී. නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා සේවා ලෙස වර්ග කළ හැකිය.

| භාණ්ඩ | සේවා |
|---|---|
| • භෞතික පැවැත්මක් ඇත. (ස්පර්ශ කළ හැකිය.)<br>• ගබඩා කළ හැකිය.<br>• සමජාතීය වන පරිදි නිෂ්පාදනය කළ හැකිය.<br>• සපයන්නාගෙන් වෙන් කළ හැකිය. | • භෞතික පැවැත්මක් නො මැත. (ස්පර්ශ කළ නොහැකිය.)<br>• ගබඩා කළ නොහැකිය.<br>• සපයන්නා අනුව වෙනස් වේ.<br>• සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය. |







Copyright © www.e-thaksalawa.moe.gov.lk

## වෙළෙඳපොළ (Market)

ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුනගැසෙන හෝ සම්බන්ධ වන ඕනෑම තත්ත්වයක් වෙළෙඳපොළ ලෙස හඳුන්වයි. මිනිස් වුවමනා ඉටුකර ගැනීමට වෙළෙඳපොල තුලින් භාණ්ඩ හා සේවා සපයා ගනී.

ව්‍යාපාර වල ගති ලක්ෂණ

- විකුණුම් හෝ හුවමාරු වීම සිදු වීම.
- භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු වීම.
- ගනුදෙනු අඛණ්ඩ ව සිදු වීම.
- ලාභයෙන් අභිප්‍රේරණය වීම.
- අවදානමක් තිබීම.
- වුවමනා නිර්මාණය කිරීම.
- ආර්ථික කටයුත්තක් වීම.



## 01. විකුණුම් හෝ හුවමාරුවීම් සිදු වීම.

සෑම ව්‍යාපාරයක්ම භාණ්ඩ හා සේවා මුදල්ම ය අගයක් මත විකිණීම හෝ හුවමාරු කිරීම සිදු කෙරේ. භාණ්ඩ හා සේවා මිලක් මත මිලදී ගැනීම හා විකිණීම ව්‍යාපාර වල අත්‍යවශ්‍ය සාධකයකි. එවැනි විකිණීමක් හෝ හුවමාරුවක් හෝ නොමැති තැන ව්‍යාපාර කටයුත්තක් සිදු නොවේ. උදාහරණයක් වශයෙන් නිවසක පවුලේ අය සඳහා ආහාර පිසීම ව්‍යාපාරයක් ලෙස නො සලකන අතර, මිලකට අන් අයට විකිණීම සඳහා ආහාර පිසීම හා විකිණීම ව්‍යාපාරයක් වේ.

## 02. භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු වීම.

සෑම ව්‍යාපාරයක්ම, අන් අයට විකිණීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සහ / හෝ මිලදී ගැනීම සිදු කරයි. ඒවා පාරිභෝගික භාණ්ඩ හෝ කාර්මික (ව්‍යාපාරික) භාණ්ඩ විය හැකි ය. පාරිභෝගික භාණ්ඩ යනුවෙන් අදහස් වන්නේ අවසාන ප්‍රයෝජනය සඳහා පාරිභෝගිකයන් මිල දී ගන්නා පාන්, ඇඳුම් , පාවහන් ආදී දේවල්ය. කාර්මික භාණ්ඩ / ව්‍යාපාරික භාණ්ඩ යනු පාරිභෝගික භාණ්ඩ නිපදවීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය., යන්ත්‍ර සූත්‍ර, ආදි දෑ ය. සේවා යන්නට අස්පෘෂ්‍ය විදුලිබලය, රක්ෂණය, බැංකු සේවය ආදිය නිදසුන්ය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

### 03. ගනුදෙනු අඛණ්ඩව සිදු වීම.

අඛණ්ඩ පදනමක් මත දිගින් දිගට ම භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු කරයිනම් එය ව්‍යාපාරයක් ලෙස හඳුන්වයි. එක් ගනුදෙනුවක් පමණක් සිදු කිරීමට ව්‍යාපාර යටතට නොගැනේ, නිදසුනක් ලෙස පුද්ගලයෙක් තමන් පාවිච්චි කරන ලද පරණ ස්කූටරය විකිණීම ව්‍යාපාරයක් නොවේ. නමුත් ඔහු අඛණ්ඩ පදනමක් මත ස්කූටරය විකිණීම සිදු කරයි නම් එය ව්‍යාපාරයකි.


### 04. ලාභයෙන් / ප්‍රතිලාභයෙන් අභිප්‍රේරණය වීම

ව්‍යාපාරයක මූලික අරමුණ මුදල් ඉපයීම හා ධනය අත්පත් කර ගැනීමයි. ඒ අනුව සාමාන්‍යයෙන් ලාභය යන්නෙහි රුපියල් ශතවලින් ලබන ලාභය, වියදමට වඩා වැඩි ආදායම, ව්‍යාපාරික සම්බන්ධතා ගොඩනගා ගැනීම, ව්‍යාපාරික අවස්ථා උදාකර ගැනීම හා සමාජ ප්‍රතිලාභ අත්කර දීම යනාදිය අන්තර්ගත වේ. ඒ අනුව

### 05. අවදානමක් තිබීම,

ලාභ ලැබීමට ඇති අවිනිශ්චිතතාවය හා අලාභ සිදුවීමට ඇති හැකියාව නිසා ව්‍යාපාරවලට අවදානමක් ඇති වේ. අනාගතය අවිනිශ්චිත නිසාත්, ව්‍යාපාර පරිසරයේ ඇතිවන වෙනස් වීම් නිසාත්, ලාභයට බලපාන පහත සඳහන් කරුණු ව්‍යාපාර වලට ප්‍රායෝගිකව පාලනය කළ නොහැකි නිසාත් අවදානම නැතහොත් අවිනිශ්චිතතා ඇති වේ.

- පාරිභෝගික රුචිය මෝස්ර සහ ඉල්ලුම වෙනස් වීම නිසා.
- යන්ත්‍ර උපකරණ හා නිෂ්පාද තාක්ෂණය වෙනස් වීම නිසා.
- වෙළෙඳපොළ තරඟකාරිත්වය ඉහළ යාම නිසා.
- අමුද්‍රව්‍ය හිඟය, විදුලිය බිඳ වැටීම හා ඉන්ධන හිඟය ඇති වීම නිසා.
- ශ්‍රමිකයින්ගේ ගැටලු, වැඩ වර්ජන ආදිය නිසා.
- ගිනිගැනීම්, සොර සතුරු උපද්‍රව, අනතුරු ආදී විපත් නිසා.





Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 06. වුවමනා නිර්මාණය කිරීම.

මිනිස් වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිපදවීම ව්‍යාපාර විසින් සිදු කරයි. සමහර ව්‍යාපාර අමුද්‍රව්‍ය නිමිභාණ්ඩ බවට පරිවර්තනය කිරීම මඟින් මිනිස් වුවමනා තෘප්තිමත් කරයි. සමහර ව්‍යාපාර යම් භාණ්ඩයක් බහුල ස්ථානයක සිට එමභාණ්ඩය සඳහා විශාල ඉල්ලුමක් පවතින වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කිරීම මගින් මිනිස් වුවමනා තෘප්තිමත් කරයි. යම් භාණ්ඩයක හිඟ කාවල දී ලබා දීම සඳහා සමහර ව්‍යාපාර එම භාණ්ඩයේ අස්වැන්න ලැබෙන කාලවල දී ඒවා රැස් කර ගබඩා කර තබා ගැනීමෙන් මිනිස් වුවමනා තෘප්තිමත් කරයි. මෙලෙස සෑම ව්‍යාපාරයක් ම භාණ්ඩ නිෂ්පාදනය හා සේවා සැපයීම කිරීම තළින් මිනිස් වුවමනා නිර්මාණය කරයි.

## 07. ආර්ථික කටයුත්තක් වීම.

හිඟ සම්පත් භාවිතයෙන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ හා බෙදා හැරීමේ කටයුතුවල නිරත වීම හේතුවෙන් ව්‍යාපාර අත්‍යවශ්‍යයෙන් ම ආර්ථික කටයුත්තක් වේ. එය මුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් සිදුවන්නකි. ව්‍යාපාර, භාණ්ඩ හා සේවා විකිණීම, හිඟ සම්පත් භාවිත කිරීම කරන බැවින් එය ආර්ථික කටයුත්තකි.

# ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු

| | | |
|---|---|---|
| 1. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම | → | මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍යය නිෂ්පාදිත ව්‍යාපාරිකයින් විසින් නිර්මාණය කරන බව. |
| 2. සම්පත් වලට අගය එකතු කිරීම | → | භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනයේදී යොදා ගන්නා සම්පත් වල ස්වරූපය වෙනස් කිරීම මගින් ඇතිවන අගය වැඩිවීම එකතු කල අගය ලෙස හැඳින්වේ. ව්‍යාපාර විසින් සිදුකරනුයේ සම්පත් වල ස්වරූපය වෙනස් කිරීමය. එම සම්පත් වල අගය වැඩි වේ. |

**පරමාර්ථ හා අරමුණු**

ව්‍යාපාරයකට විවිධ පරමාර්ථ හා අරමුණු තිබිය හැකිය.

| | |
|---|---|
| **පරමාර්ථ Goals -** | සංවිධානයක් දිගු කාලයක් තුල සාක්ෂාත් කර ගැනීමටබලාපොරොත්තු වන අපේක්ෂාවන් පරමාර්ථ ලෙස හඳුන්වයි. |
| **අරමුණු Object -** | සංවිධානයක් කෙටි කාලයක් තුල දී සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂාවන් අරමුණු නම් වේ. කාලය සමඟ සම්බන්ධ වන |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

උදා:

| | | |
|---|---|---|
| ලාභ උපරිම කිරීම | - | 2020 වර්ෂය තුලදී ව්‍යාපාරික ලාභය 12% ඉහල නංවා ගැනීම |
| විකුණුම් උපරිම කිරීම | - | 2020 වර්ෂය තුලදී ව්‍යාපාරික ලාභය 6%කින් ඉහළ නංවා ගැනීම. |
| වෙළෙඳ පොල කොටස | - | ඉදිරි වර්ෂය තුලදී වෙළෙඳ පොල කොටස 5%කින් වැඩිකර ගැනීම. |
| සේවක සුභ සාධනය | - | ඉදිරි වර්ෂය තුලදී සේවක සුභ සාධනය 7%කින් ව්‍යාපාර අරමු ණක තිබිය යුතු ගුණාංග ඉහල නැංවීම. |

## අරමුණක තිබිය යුතු ගුණාංග.

- නිශ්චිත වීම / සුවිශේෂී වීම - Specific
- නිය හැකි වීම - Measurable
- ලඟාකරගත හැකි බව - Achievable
- යථාර්ථවාදී බව - Realistic / Rational
- නිශ්චිත කාලසීමාවක් දක්වා තිබීම - Time bounded



## ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාරවල දායකත්වය.

- වෙනස් වන සංකීර්ණ වුවමනා සපුරාලීම.
- නවෝත්පාදනය
- රැකියා උත්පාදනය
- ජාතික ආර්ථිකය වර්ධනය.


## ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාරවල දායකත්වය.

- වෙනස් වන සංකීර්ණ වුවමනා සපුරාලීම.
- නවෝත්පාදනය.
- රැකියා උත්පාදනය.
- ජාතික ආර්ථිකය වර්ධනය.



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 1.2 ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා අධ්‍යයනය කරයි.

ස්වයං පෝෂිත අර්ථක්‍රමය කිසියම් රටක් හෝ ආර්ථිකයක් තම රටට හෝ ආර්ථිකයට අවශ්‍ය දේ තම රට හෝ ආර්ථිකය තුලින්ම නිපදවා ගනු ලබයි නම් එම ස්වයං පෝෂිත ආර්ථිකයක් ලෙස හඳුන්වනු ලබයි.

| **<u>සෘජු නිෂ්පාදනය</u>** | **<u>වක්‍ර නිෂ්පාදනය</u>** |
|---|---|
| **තමාට අවශ්‍ය දේ තමා විසින්ම නිෂ්පාදන කර ගැනීම සෘජු නිෂ්ප්පාදනය ලෙස හඳුන්වයි.** | **වෙළෙඳපොළ සඳහා නිශ්පාදන කටයුතු සිදු කිරීම වක්‍ර නිෂ්පාදනය ලෙස හඳුන්වයි.** |

### ව්‍යාපාර විකාශනයේ අවස්ථා.



භාණ්ඩ හුවමාරුව

⇩

මුදල් භාවිතය

⇩

කාර්මික විප්ලවය

⇩

භාණ්ඩ හුවමාරුව



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## භාණ්ඩ හුවමාරු ක්‍රමය

ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටී මිනිසා තම අතිරික්තය හුවමාරු කර ගැනීමේ ක්‍රමය  නැතිනම් භාණ්ඩයට භාණ්ඩ හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලියල භාණ්ඩ හුවමාරු ක්‍රමය (බාටර් ක්‍රමය )ලෙස හඳුන්වයි.

**මේ සඳහා සම්පූර්ණ විය යුතු  කොන්දේසි පහත දැක්වේ.**

- ◊ දෙපාර්ශවයක් සිටිය යුතුය.
- ◊ එක් පාර්ශවයක් අනෙක් පාර්ශවය අගය කරන දෙයක් තිබිය යුතු වීම.
- ◊ දෙපාර්ශවය අතර සන්නිවේදනය කළ හැකි වීම.
- ◊ හුවමාරුව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නිදහස තිබිය යුතු වීම.



### මුදල් භාවිතය

- ද්‍රව්‍ය භාවිතය

  උදා - දුම්කොළ, ඇත්දළ,සිප්පි කටු, සහල්

- ලෝහ වර්ග භාවිතය

  උදා- යකඩ, තඹ ,  රිදී ,රන්

- ලෝහ කාසි මුදල් භාවිතය

  විවිධ ප්‍රමාණ වලින් යුත් ලෝහ කැබලි වල මුහුණත බර, පිරිසිදු බව සහ අගයන් සඳහන් කරන ලදී. පසුකාලීනව ඇති වූ අච්චු කාසි වලට පදනම මෙයයි.

- කාසි හා නෝට්ටු භාවිතය

  රජයේ බලයලත් අධිකාරිය (මහා බැංකුව) විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු

- මෙයට අයත්ය.

  උදා -   ශ්‍රී ලංකාව - රුපියල්

  මහා බ්‍රිතාන්‍ය - පවුම්

- බැංකු මුදල් භාවිතය

  බැංකු ජංගම ගිණුම ආශ්‍රිත චෙක්පත් භාවිතය මගින් ප්‍රයෝජනයට ගනු ලබන මුදල් ශේෂ




Copyright © www.e-thaksalawa.moe.gov.lk

- විද්‍යුත් මුදල් භාවිතය

තොරතුරු තාක්ෂණයේ හා ඩිජිටල් තාක්ෂණයේ දියුණුව සමඟ හඳුන්වා දුන් පරිගණක ජාලයක් මඟින් සිදුවන ක්‍රමයකි.

උදා - ණය පත් , හර පත් , පෙර ගෙවුම් කාඩ් පත්

## මුදලේ ක්‍රමික විකාශනය







### කාර්මික විප්ලවය (ක්‍රි.ව 1700 -1830)

යුරෝපීය රටවල ඇති වූ කාර්මික ප්‍රබෝධය සමඟ ගෘහ කර්මාන්තල මහා පරිමාණ කර්මාන්ත බවට පත් වී වෙළෙඳාමේ ප්‍රසාරණයක් ඇති විය.

කාර්මික විප්ලවයත් සමඟ ව්‍යාපාර සඳහා වූ උපකාරක සේවා වලදී වර්ධනයක් ඇති විය.


වෙළෙඳාම හා උපකාරක සේවා වල එකතුවල වාණිජ්‍යය වේ.

## වාණිජ්‍ය (Commerce)

නිෂ්පාදිතයක් නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා තෙක් හුවමාරු වීමේ දී සිදුවන සමස්ථ අතරමැදි කටයුතු වාණිජ්‍ය ලෙස හැඳින්විය හැකිය.



Copyright © www.e-thaksalawa.moe.gov.lk




## වෙළෙඳාම

ගැණුම්කරුවෙකු හා විකුණුම්කරුවෙකු අතර කිසියම් ප්‍රතිස්ථාවකට නිෂ්පාදිත භාණ්ඩ හා සේවා වල අයිතිය හුවමාරුවීමේ ක්‍රියාවලිය වෙළෙඳාම ලෙස හඳුන්වනු ලබයි.

## උපකාරක සේවා/ ව්‍යාපාර සහය සේවා

වෙළෙඳාමක් බිහි කිරීම සඳහාත්, එම බිහිකරන ලද වෙළෙඳාම සාර්ථකව පවත්වා ගෙන යාම සඳහාත් අවශ්‍ය කරන සේවාල උපකාරක සේවා ලෙස හඳුන්වනු ලබයි.

**විද්‍යුත් වාණිජ්‍ය**

වෙළෙඳ කටයුතු සඳහා මෙන්ම වෙළෙඳාම සඳහා සහය වනසන්නිවේදන, ප්‍රවාහනය, ගබඩාකරණය වැනි උපකාරක සේවා කටයුතු සඳහා ද අන්තර්ජාලය භාවිතා කරයි නම් එය විද්‍යුත් වාණිජ්‍ය ලෙස හඳුන්වයි.

**විද්‍යුත් ව්‍යාපාර**

අලෙවිකරණය, බෙදාහැරීම, මූල්‍ය කටයුතු, පරිපාලන කටයුතු ආදි සිය`ළු ම ව්‍යාපාරකටයුතු අන්තර් ජාලය යොදාගෙන සිදු කරයි නම් එවැනි ව්‍යාපාර විද්‍යුත් ව්‍යාපාර ලෙස හඳුන්වයි.

**විද්‍යුත් වෙළෙඳාම**

භාණ්ඩ හා සේවා විකිණීම සහ මිලදී ගැනීමට අදාල කටයුතු අන්තර් ජාලය හරහා සිදුවන්නේ නම් එම වෙළෙඳාම විද්‍යුත් වෙළෙඳාම ලෙස හඳුන්වයි.

අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත
පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## විද්‍යුත් වාණිජ්‍ය වර්ථමානයේ ප්‍රචලිත වීමට බලපෑ හේතු,

- ලියකියවිලිවලින් තොර ව ව්‍යාපාර තොරතුරු හුවමාරු කිරීමට හැකි වීම.
- ව්‍යාපාර කටයුතු වේගවත් වීම.
- මෙහෙයුම් පිරිවැය, තොග පරිවැය අඩු වීම.
- ගෝලීය වූ වෙළෙඳපොළ අවකාශයක් බිහි වීම.
- භාණ්ඩ හා සේවාවල ගුණාත්මය ඉහළ යාම.
- ගනුදෙනුකරුවන්ගේ කලාය හා ශ්‍රමය ඉතුරු වීම.
- පරිගණක සාක්ෂරතාව වැඩි වීම.
- යටිතල පහසුකම්වල වර්ධනය .



## තොරතුරු තාක්ෂණය

තොරතුරු" යන්න අතීතයේ සිට අනාගතය දක්වා වාණිජ්‍යය වර්ධනයට අත්‍යාවශ්‍ය සාධකයකිග වර්තමානයේ පවතින්නේ විද්‍යුත් වාණිජ්‍යය සහ විද්‍යුත් ව්‍යාපාර පදනම් යුගයකිග අන්තර්ජාලය හරහා ව්‍යාපාර වලට අදාළ සියලුම කාර්යයන් සිදු කිරීම විද්‍යුත් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වී ඇති ප්‍රවණතා රාශියකි.

- ගෝලීයකරණය ව්‍යාප්ත වීම.
- විද්‍යුත් ව්‍යාපාර බිහිවීම.
- විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම.
- පරිසරය පිළිබඳ සැළකිලිමත් වීම.
- ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැළකිලිමත් වීම.





Copyright © www.e-thaksalawa.moe.gov.lk

වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති ප්‍රවණතා

- ගෝලීයකරණය ව්‍යාප්ත වීම.
- විද්‍යුත් ව්‍යාපාර බිහි වීම.
- විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම.
- පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම.
- ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වීම.

## 1. 3 විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග

ඔබ ප්‍රදේශයේ පිහිටි ව්‍යාපාර හැකිතාක් නම් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| ව්‍යාපාරයේ නම | නිෂ්පාදනයේ ස්වභාවය අනුව | | | හිමිකාරිත්වය අනුව | | අරමුණ අනුව | | පරිමාණය අනුව | | නිෂ්පාදන අංශය අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාථමික | ද්විතීයික | තෘතීයික | පෞද්ගලික | පොදු | ලාභ අරමුණු කරගත් | ලාභ අරමුණු කර නොගත් | ක්ෂුද්‍ර කුඩා මධ්‍ය පරිමාණ | මහා පරිමාණ | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
| | | | | | | | | | | | | |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

ව්‍යාපාර වර්ගීකරණ පදනම්

- නිෂ්පාදනයේ ස්වභාවය අනුව
- හිමිකාරිත්වය අනුව
- අරමුණ අනුව
- පරිමාණ අනුව
- නිෂ්පාදන අංශය අනුව/ කර්මාන්ත මූල්‍ය අනුව

**ව්‍යාපාර වර්ගීකරණ පදනම්**

- නිෂ්පාදනයේ ස්වභාවය අනුව
  - ප්‍රාථමික
  - ද්විතීයික
  - තෘතීයික
- හිමිකාරිත්වය අනුව
  - පෞද්ගලික
  - පොදු
- අරමුණ අනුව
  - ලාභ අරමුණු කරගත්
  - ලාභ අරමුණු කර නොගත්
- පරිමාණය අනුව
  - සුළු හා මධ්‍ය පරිමාණ
  - මහා පරිමාණ
- නිෂ්පාද අංශය අනුව
  - කෘෂිකාර්මික
  - කාර්මික
  - සේවා





අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය



Copyright © www.e-thaksalawa.moe.gov.lk

- නිෂ්පාදනයේ ස්වභාවය අනුව ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික ලෙස ව්‍යාපාර වර්ගීකරණය කළ හැකි ය.
- ඒ අනුව ස්වභාව ධර්මයෙන් ලැබී ඇති දේ ඒ ආකාරයෙන් ම ප්‍රයෝජනයට ගන්නා නිෂ්පාදන ව්‍යාපාර ප්‍රාථමික අංශයටත්, එම නිෂ්පාදන නැවත වෙනස් කිරීමට භාජනය කිරීමේ ව්‍යාපාර ද්විතීයික අංශයටත් සියලු ම සේවා සැපයීමේ ව්‍යාපාර තෘතීයික අංශයටත් අයත් වේ.
- නිෂ්පාදනයේ ස්වභාවය අනුව ප්‍රාථමික, ද්විතීයික, හා තෘතියික ලෙස වර්ගීකරණය පහත ලෙස දැක්විය හැකි ය.

ප්‍රාථමික අංශය

- කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය
- පතල් හා කැණීම් කර්මාන්තය

ද්විතීයික අංශය -

- නිෂ්පාදන කර්මාන්ත
- ඉදි කිරීම් කර්මාන්ත

තෘතීයක අංශය-

- විදුලිය, ගැස් වාෂ්ප හා වායු සමීකරණ සැපයීම.
- ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරිම
- මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණය සහ එම ද්‍රවය ප්‍රතිචක්‍රීකරණය
- වෙළෙඳාම්, ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීම හා ආහාරපාන සැපයීම
- තොරතුරු සහ සන්නිවේදන කටයුතු
- මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය හා දේපළ වෙළෙඳාම් වෘත්තීය ම ය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා
- රාජ්‍ය පරිපාලන, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය,
- සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා

- හිමිකාරිත්වය අනුව පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා පොදු රාජ්‍ය අංශයේ ව්‍යාපාර ලෙස ව්‍යාපාර වර්ගය කළ හැකි ය.
- අරමුණ අනුව ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර හා ලාභ අරමුණු කර නො ගත් ව්‍යාපාර ලෙස ව්‍යාපාර වර්ග කළ හැකි වේ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- නිෂ්පාදන අංශ නැතිනම් කර්මාන්ත මූලය අනුව කෘෂිකාර්මික, කාර්මික හා සේවා ව්‍යාපාර ලෙස වර්ග කළ හැකි ය.
- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආශික සංයුතිය ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ පල කෙරේ.
- ශ්‍රී ලංකාවේ මහ බැංකු වාර්ෂික වාර්තාවේ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය පහත දැක්වේ.


**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය**
**(2010 ස්ථාවර මිල අනුව )**

| ආර්ථික කටයුතු | ද.දේ.නි.ට දායකත්වය (%) 2015 |
|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **7.9** |
| ධාන්‍ය වගාව (වී හැර) | 0.2 |
| වී වගාව | 0.9 |
| එළවළු වගාව | 0.8 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 0.0 |
| පළතුරු වගාව | 0.6 |
| තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්,තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 0.8 |
| තේ වගාව | 0.8 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා, ආදී) | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 0.7 |
| රබර් වගාව | 0.3 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 0.6 |
| පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 0.1 |
| වන වගාව, ගස් කැපීම, හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 0.6 |
| ධීවර කර්මාන්තය | 1.4 |
| **කර්මාන්ත** | **26.2** |
| පතල් හා කැණීම් කර්මාන්තය | 2.3 |
| නිෂ්පාදන කර්මාන්ත | 15.7 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 1.0 |
| ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම | 0.1 |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 6.8 |
| **සේවාවන්** | **56.6** |
| වෙළෙඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 23.2 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 0.6 |
| මූල්‍ය රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළෙඳාම | 12.3 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 11.8 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 8.7 |
| **මූලික මිලගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **90.7** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 9..3 |
| **වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි)** | 100.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2015


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 1.4 ව්‍යාපාර යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි.




භූමිය

- ගොඩනැගිලි පිහිටා ඇති ඉඩම.
- ලැබෙන වාතාශ්‍රය .
- හිරු එළිය (ස්වභාවික ආලෝකය).

ශ්‍රමය

- ඇදුම් මසන්නාගේ කායික හා මානසික ශ්‍රමය.
- සුපරික්ෂකවරුන්ගේ කායික හා මානසික ශ්‍රමය.
- කළමනාකරුවන්ගේ මානසික ශ්‍රමය
- මුරකරුවන්ගේ ශ්‍රමය.

ප්‍රාග්ධනය

- ගොඩනැගිල්ල
- මහන මැෂින් ,උපකරණ
- බෙදාහැරීමේ රථ
- රෙදි , නූල් , බොත්තම
- මුදල්






Copyright © www.e-thaksalawa.moe.gov.lk

ව්‍යවසායකත්වය

- සම්පත් සංකලනය පිළිබඳ තීරණ ගන්නා (ලාභය භුක්ති විදින්නා).
- අවදානම දරමින් තීරණ ගන්නා.
- පුද්ගලයින් හෝ ආයතන.



තොරතුරු

- පාරිභෝගික රුචියට අනුව ගැලපෙන මෝස්තර.
- අමුද්‍රව්‍ය පිළිබඳ නව තොරතුරු.
- නව තාක්ෂණ පිළිබඳ තොරතුරු.
- වෙළඳපොල පිළිබඳ තොරතුරු.



කාලය

- සේවකයින් සේවයේ නිරත වන කාලය.
- යන්ත්‍ර සේවයේ යොදවා ගන්න කාලය.
- තීරණ ගැනීම සදහා ගත කරන කාලය.



දැනුම

- නව නිමැවුම සඳහා ලැබෙන පෙන්ටන්ට් බලපත්‍ර ලබා ගැනීම.
- ඇගලුම් සේවකයින්ගේ කුසලතා .
- කළමනාකරුවන් සතු දැනුම.
- මෝස්තර නිර්මාණ ශිල්පීන්ගේ දැනුම.
- නීති උපදෙස්.



ව්‍යාපාර කාර්යයන්

- පරිපාලනය
- අලෙවිකරණය
- මානව සම්පත් කටයුතු
- තොරතුරු කළමනාකරණ කටයුතු
- නිෂ්පාදනය
- මූල්‍ය කටයුතු
- පර්යේෂණ හා සංවර්ධන


Copyright © www.e-thaksalawa.moe.gov.lk

| කාර්යයන් | නිදසුන් |
| --- | --- |
| ⇒ පරිපාලනය. | • ඇගළුම් සේවක ලිපිගොනු සැකසීම .<br>• අදාල උපදෙස් සැපයීම.<br>• පැමිණීමේ ලේඛන පවත්වාගෙන යාම. |
| ⇒ නිෂ්පාදනය. | • අමුද්‍රව්‍ය සපයා ගැනීම.<br>• තොග පාලනය.<br>• තත්ත්ව පාලනය. |
| ⇒ අලෙවිකරණ. | • ඇගළුම් බෙදා හැරීම.<br>• ප්‍රචාරණය.<br>• මිල තීරණය කිරීම. |
| ⇒ මූල්‍ය කටයුතු | • අරමුදල් සපයා ගැනීම.<br>• වැටුප් ගෙවීම.<br>• අරමුදල් යෙදවීම. |
| ⇒ මානව සම්පත් කටයුතු | • සේවකයින් බඳවා ගැනීම.<br>• පුහුණු කිරීම.<br>• උසස් කිරීම. |
| ⇒ පර්යේෂණ හා සංවර්ධන . | • නව නිර්මාණ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.<br>• නිෂ්පාදන වැඩි දියුණු කිරීම.<br>• අඩු පිරිවැය ක්‍රම සොයා බැලීම. |
| ⇒ තොරතුරු කළමනාකරණ කටයුතු | • තොරතුරු පද්ධති පවත්වාගෙන යාම.<br>• නව තොරතුරු සම්පාදනය කර ගැනීම.<br>• තොරතුරු යාවත්කාලීන කිරීම. |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

ව්‍යාපාර යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස

| <u>යෙදවුම් /සම්පත්</u> | <u>ව්‍යාපාර කාර්යයන්</u> | <u>ව්‍යාපාර කාර්යයන්</u> |
|---|---|---|
| භූමිය<br>ශ්‍රමය<br>ප්‍රාග්ධනය<br>ව්‍යවසායකත්ව<br>තොරතුරු<br>කාලය<br>දැනුම | පරිපාලනය<br>මෙහෙයුම් (නිෂ්පාදන)<br>අලෙවිකරණ<br>මූල්‍ය කටයුතු<br>මානව සම්පත් කටයුතු<br>පර්යේෂණ හා සංවර්ධන<br>තොරතුරු<br>කළමනාකරණය | භාණ්ඩ හෝ සේවා |



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත
පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය
Copyright © www.e-thaksalawa.moe.gov.lk

බේකරියක ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස පහත රූප සටහනකින් දැක්වේ.

## යෙදවුම්

- භූමිය
  - බේකරිය පිහිටි ඉඩම
- ශ්‍රමය
  - පාන් පුළුසන්නාගේ ශ්‍රමය
- ප්‍රාග්ධනය
  - ගොඩනැගිල්ල
  - පෝරණුව,තැටි ,පිටි
- ව්‍යවසායකත්වය
  - බේකරිය අයිතිකරු/ සාධක සංයෝග කරන්නාගේ හැකියාව
- තොරතුරු
  - නව ශිල්පීය ක්‍රම
  - වෙළඳපොල තොරතුරු
- කාලය
  - සේවකයින් වැඩ කරන කාලය
  - අතිකාල වැඩ
- දැනුම
  - සේවක කුසලතා
  - නව නිෂ්පාදන පිලිබඳ දැනුම

→


## කාර්ය

- නිෂ්පාදනය
  - ද්‍රව්‍ය සපයා ගැනීම
  - ද්‍රව්‍ය මිශ්‍ර කිරීම
  - පාන් සැකසීම
- අලෙවිකරණ
  - ප්‍රචාරණය කිරීම
  - බෙදා හැරීම
  - මිල නියම කිරීම
- පරිපාලන
  - සේවක ලිපි ගොනු සැකසීම
  - සේවක පැමිණීමේ
  - ලේඛණ පැමිණීමේ
  - ලේඛණ පවත්වා ගැනීම
- මූල්‍ය කටයුතු
  - අවශ්‍ය මුදල් සපයා ගැනීම
  - වත්කම් මිලට ගැනීම
  - වියදම් ගෙවීම
- මානව සම්පත් කටයුතු
  - ශ්‍රමිකයන් බඳවා ගැනීම
  - පුහුණු කිරීම
  - උසස් කිරීම
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු
  - සමීක්ෂණ පැවැත්වීම
  - නිෂ්පාදන ගුණාත්වය වර්ධනය කිරීමට පර්යේෂණ පැවතීම

→

## නිමැවුම්

පාන්
බනිස්
කේක්
(බේකරි අයිතම)



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 1.5 ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව




**අයිතිකරුවන්**

- තමන් ආයෝජනය කල මුදලට ප්‍රමාණවත් ලාභයක් ලැබේ දැයි  දැන ගැනීමට.
- ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ දැන ගැනීමට.
- වෙළඳපළ කොටස දැන ගැනීමට.

**කළමණාකරුවන්**

- ව්‍යාපාරයේ ලාභය උපරිම කිරීමට.
- ව්‍යාපාර වර්ධනය පිළිබද ව දැන ගැනීමට.
- කළමනාකරණය තීරණ වල  සාර්ථක අසාර්ථක බව දැන ගැනීමට.

**සේවකයන්**

- ඉහල වැටුපක් ලබා ගැනීමට.
- ප්‍රසාද  දීමනා ලැබේ දැයි දැන ගැනීමට .
- රැකියාවේ උසස්වීම ලබා ගැනීමට.

**ණයහිමියෝ**

- සපයන ලද ණය  මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව දැන ගැනීමට.
- ණය මුදලේ සුරක්ෂිත බ දැන ගැනීමට.
- ඇප සුරකුම්වල සුරක්ෂිත  බව තහවුරු කර ගැනීමට.

**පාරිභෝගිකයෝ**

- ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීමට .
- වගකීම නිසි පරිදි ඉටු කරන්නේ දැයි බැලීමට.
- ව්‍යාපාරයේ  පැවැත්ම තහවුරු කිරිමට.

**සැපයුම්කරුවෝ**

- අඛණ්ඩ ඇනවුම් ලබා ගැනීමට.
- සපයන ලද භාණ්ඩ සඳහා මුදල් ආපසු අය කර ගැනීමට.

**විශ්ව අයෝජකයෝ**

- තමන් සතු අනාගතයේ  දී  එම ව්‍යාපාරයේ ආයෝජනය කිරීමට.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**රජය**

- බදු අයකර ගැනීමට / බදු සහන ලබා දීමට.
- සේවා නියුක්තිය වර්ධනය කිරීමට.
- ආර්ථික සංවර්ධනය පිළිබඳ මැන බැලීමට.

**ප්‍රජාව**

- පරිසරය සුරැකීම පිළිබඳ සොයා බැලීමට .
- රැකියා අවස්ථා ලබා ගැනීමට.

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව , ව්‍යාපාරයට වැදගත් වීම හේතු කිහිපයක් පහත සඳහන් වේ.

**අයිතිකරුවන්**

- යෝජනා වැඩි කර ගැනීමට.
- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට.

**සේවකයෝ**

- සේවක කාර්යක්ෂමතාව වැඩිකර ගැනීමට.
- සේවකයන් රඳවා ගැනීමට.
- සේවක ආකර්ෂණ ය ලබා ගැනීමට.

**ණය හිමියෝ**

- අඛණ්ඩ ව අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට.
- අඩු අරමුදල් සම්පාදනය කර ගැනීමට.

**රජය**

- බදු සහන ලබා ගැනීමට.
- යටිතල පහසුකම් ලබා ගැනීමට.
- තාක්ෂණික දැනුම ලබා ගැනීමට.

**ගනුදෙනුකරුවෝ**

- අදාළ භාන්ඩ හෝ සේවා සඳහා වෙළඳ පොළ සුරක්ෂිත කර ගැනීමට.
- පාරිභෝගික විශ්වාස ගොඩනගා ගැනීමට.
- ගනුදෙනු කරුවන්ගේ පක්ෂපාතීත්වය ඇති කර ගැනීමට.





Copyright © www.e-thaksalawa.moe.gov.lk

ශිෂ්‍යයා කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව

**ශිෂ්‍යයා**

- ආදිසිසුන්
- ගුරුවරුන්
- යහලුවන්
- විදුහල්පති
- සහෝදර සහෝදරියන්
- රජය
- නෑදෑයන්

වාණිජ්‍ය බැංකුවක් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව

**වාණිජ බැංකුව**

- කළමනාකරු
- ගනුදෙනුකරුවන්
- අයිතිකරුවන්/ කොටස් හිමියන්
- ප්‍රජාව
- රජය
- තරඟකරුවන්

## 1.6 ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරය වර්ග කරයි.

### හැදින්වීම

ව්‍යාපාර කටයුතු කෙරහි බලපෑම් ඇති කරන සාධක ක්‍රියාත්මක වන පරිසරය ව්‍යාපාර පරිසරය ලෙස හඳුන්වයි.

ව්‍යාපාර පරිසරය

- අභ්‍යන්තර පරිසරය
  - අයිතිකරු
  - කළමනාකරුවෝ
  - සේවකයෝ
  - සංවිධාන ව්‍යුහය
  - සංවිධානමය සංස්කෘතිය සම්පත්
- බාහිර පරිසරය
  - ආසන්න පරිසරය
    - පාරිභෝගිකයෝ
    - සැපයුම්කරුවෝ
    - තරඟකරුවෝ
    - ආදේශන භාණ්ඩ නිෂ්පාදකයෝ
    - වෙළෙඳපොළටට පිවිසීමට අපේක්ෂා
  - සාර්ව පරිසරය
    - ආර්ථික පරිසරය
    - දේශපාලන පරිසරය
    - නෛතික පරිසරය
    - ප්‍රජා පරිසරය
    - තාක්ෂණික පරිසරය
    - ස්වභාවික පරිසරය
    - සමාජ හා සංස්කෘතික පරිසරය


Copyright © www.e-thaksalawa.moe.gov.lk

ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරිකයෙකුට පහත ප්‍රයෝජන අයත් වේ.

- ◊ ශක්තීන් හඳුනාගැනීම.
- ◊ දුර්වලතා හඳුනාගැනීම.
- ◊ ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම.
- ◊ තර්ජන හඳුනා ගැනීම.

**අභ්‍යන්තර පරිසරය**

සංවිධානය තුල සිටින එයට බලපෑම් කරන කණ්ඩායම් හා තත්ත්ව ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය ලෙස හඳුන්වයි.

**බාහිර පරිසරය**

ව්‍යාපාරයට බලපෑම් කරන ව්‍යාපාර ආයතනයයට පිටතින් ඇති සියළුම දේ බාහිර පරිසරය ලෙස හඳුන්වයි.

**ආසන්න පරිසරය**

ව්‍යාපාර බාහිර පරිසරයට අයත් ව්‍යාපාරයට බලපෑම් ඇති කරන සුවිශේෂි සංවිධාන හෝ කණ්ඩායම් ආසන්න පරිසරය ලෙස හඳුන්වයි.


**සාර්ව පරිසරය**

ව්‍යාපාරයයක පුළුල් වටපිටාව සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම් සාර්ව/ පොදු පරිසරය ලෙස හඳුන්වයි.



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත
පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය
Copyright © www.e-thaksalawa.moe.gov.lk

වයාපාර පරිසරය වර්ග කිරීම පහත රූප සටහනින් ද පෙන්විය හැකි ය .





Copyright © www.e-thaksalawa.moe.gov.lk

**නිපුණතා මට්ටම 1.7 ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග, ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.**

## ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර බලවේග:

| | | |
|---|---|---|
| **අයිතිකරුවන්** | - | ව්‍යාපාරයකට සම්පත් සැපයූ නැතහොත් අරමුදල් ආයෝජනය කළ ලාභ හෝ පාඩු විඳදරා ගන්නා පාර්ශවය අයිතිකරුවන් වේ. |
| **කළමනාකරුවන්** | - | ව්‍යාපාරික සැලසුම් සකස් කිරීම හා තීරණ ගනු ලබන පාර්ශවය කළමනාකරුවන් වේ. |
| **සේවකයන්** | - | ඉහළ කළමනාකරුවන් විසින් සකසන සැලසුම් හා ගනු ලබන තීරණ අනුව පහළ මට්ටමවල අදාළ කාර්යයන්හි නිරත පාර්ශව සේවකයින් වේ. |
| **සංවිධානමය සංස්කෘතිය** | - | ව්‍යාපාරයේ සිටින සියලු ම දෙනා අතර බෙදාහදා ගන්නා හා ඊළඟ පරම්පරාව වෙත පවරා දෙනු ලබන විශ්වාස, වටිනාකම්, ආකල්ප, ප්‍රතිමාන, පුරුදු, හැසිරීම් රටටා සංවිධානය සංස්කෘතිය වේ. |
| **සංවිධාන ව්‍යුහය** | - | සංවිධානයේ අරමුණු පහසුවෙන් ලඟා කර ගැනීමට හැකි වන පරිදි, සංවිධානයේ කටයුතු සම්පත් හා අධිකාරිය බෙදී යන ආකාරය සංවිධාන ව්‍යුහය වේ. |
| **සම්පත්** | - | භාණ්ඩ හෝ සේවා නිපදවීම සඳහා යෙදවුම් ලෙස භාවිත කරන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, කාලය, තොරතුරු හා දැනුම යනා දී සියල්ල සම්පත් වේ. |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

| පරිසර සාධක | ශක්තීන් | දුර්වලතා |
|---|---|---|
| අයිතිකරුවන් | වැඩි සංඛ්‍යාවක් සිටීම.<br>ඔවුන්ගේ මූල්‍ය ශක්තිය වැඩි වීම.<br>ඔවුන්ගේ දැනුම හා පළපුරුද්ද වැඩි වීම. | සංඛ්‍යාත්මක ව කුඩා වීම.<br>මූලය ශක්තිය හීන වීම.<br>දැනුම හා කුසලතා අඩු වීම. |
| කළමනාකරුවන් | පුහුණුව හා පළපුරුද්ද වැඩි වීම.<br>නිවැරදි තීරණ ගැනීමේ හැකියාව | පුහුණුව හා පළපුරුද්ද අඩු වීම.<br>තීරණ ගැනීම පසුබට වීම.<br>වැරදි තීරණ ගැනීම. |
| සේවකයින් | දක්ෂ, පළපුරුදු සේවකයින් සිටීම.<br>විවිධ හැකියාවන්ගෙන් යුතු වීම.<br>යහපත් ආකල්ප දැරීම.<br>අභිප්‍රේරණය වූ සේවකයින් සිටීම. | නුපුහුණු සේවකයින් සිටීම.<br>වගකීමෙන් හා වගවීමෙන් තොර සේවකයින් සිටම.<br>අයහපක් වැඩ පුරුදු පැවතීම.<br>සෘණ ආකල්ප දැරීම. |
| සංවිධානමය සංස්කෘතික | ධනාත්මක ඇගැයීම් හා හර පද්ධතියක් පැවතීම.<br>ආවේණික, දියුණු චර්යා ධර්ම හා පුරුදු පැවතීම. | මනා හර පද්ධති, චර්යා ධර්ම<br>පද්ධති ස්ථාපිත නො වීම.<br>ඉහළ අධීක්ෂණයක් නොතිබීම. |
| සංවිධාන ව්‍යුහය | උචිත පරිදි වැඩ බෙදා දීම.<br>උචිත පරිදි සංවිධානය ගොඩනගා තිබීම. | භූමිකා අතර ගැටුම් ඇති වීම.<br>අංශ අතර මනා සම්බන්ධීකරණයක් නොවීම. |
| සම්පත් | ප්‍රමාණාත්මක බව<br>ගුණාත්මක බව | යල් පනින ලද සම්පත් තිබීම.<br>සම්පත් ඌනතාව<br>ප්‍රමාණවත් සම්පත් නොතිබීම. |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 1.8 : ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

### ආසන්න පරිසර බලවේග

**ගනුදෙනුකරුවන්** :- ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවා මිලට ගන්නන්

**සැපයුම්කරුවන්** :- ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් සපයන පුද්ගලයන් හා ආයතන

**තරඟකරුවන්** :- ව්‍යාපාරය ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවලට සමාන නිෂ්පාදිත ඉදිරිපත් කරන වෙනත් ව්‍යාපාර

**ආදේශන භාණ්ඩ නිෂ්පාදකයන්** :- ව්‍යාපාරය ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවට විකල්ප භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කරන්නන්.

**විභව ව්‍යාපාරිකයන්** :- වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂිත නව ව්‍යාපාරිකයන්

- ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවා මිලට ගන්නන්, පාරිභෝගිකයින් වේ.
- පාරිභෝගිකයින් දැනුවත් බව, පාරිභෝගිකයින්ගේ ආදායම් යනා දී කරුණු සමහර ව්‍යාපාරවලට අවස්ථා උදා කරන අතර සමහර ව්‍යාපාරවලට තර්ජන ද ඇති කරයි.
- ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් සපයන පුද්ගලයින් හා ආයතන සැපයුම්කරුවන් වේ.
- සැපයුම්කරුවන් කලට වේලාවට ගුණාත්මක ද්‍රව්‍ය සැපයීම හෝ නො සැපයීම, වට්ටම් ලැබීම හෝ නො ලැබීම යනා දී කරුණු ව්‍යාපාරවලට අවස්ථා මෙන්ම තර්ජන ද ඇති කරයි.
- ව්‍යාපාර ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවලට සමාන නිෂ්පාදිත ඉදිරිපත් කරන වෙනත් ව්‍යාපාර තරගකරුවන් වේ.
- නව තරගකරුවන් වෙළෙඳපොළට පැමිණීම, වෙළෙඳපොළේ සිටින තරගකරුවන් ඉවත් වීම, තරගකරුවන් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා සමග විවිධ පහසුකම් සැලසීම ව්‍යාපාරවලට අවස්ථා මෙන් ම තර්ජන ද උදා කරයි.
- ව්‍යාපාරය ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවවාට විකල්ප භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කරන්නන් ආදේශන භාණ්ඩ නිපදවන්නන් වේ.
- ආදේශන භාණ්ඩ වෙළෙඳපොළේ බහුල වීම, ව්‍යාපාරයට තර්ජනයක් වන අතර එය වෙනත් ව්‍යාපාරික අවස්ථාවක් උදා කිරිමට ද හේතු වේ.
- වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂාවෙන් සිටින්නන් ද පවතින ව්‍යාපාරයකට අවස්ථා හා තර්ජන ඇති කරයි.

අන්තර්ගතය සැකසීම :- **බස්නාහිර පළාත , සබරගමුව පළාත**

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 1.9 : සාර්ව පරිසර බලවේග ව්‍යපාර කෙරහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

### දේශපාලන පරිසරය

රාජ්‍ය නියෝජිත ආයතන, පවතින රජයේ දේශපාලන ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපෑම් කරයි.

නිදසුන් : රජයේ දේශපාලන දර්ශනය හා ප්‍රතිපත්ති .

විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම.

එමෙන්ම ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණදීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතුය.

### නෛතික පරිසරය

රජයේ අණපනත් හා පනවන නීති රීති එම රටේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරයි.

නිදසුන් : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත

කම්කරු නීති රීති , ශ්‍රී ලංකා ප්‍රමිති පනත

මෙම නීති රීති හා අණපනත්වලට අනුකූල ව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමටත් එමගින් ඇති වන අවස්ථා හා තර්ජනවලට මුහුණදීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතුය.

### ආර්ථික පරිසරය

ව්‍යාපාරවල පැවැත්ම සඳහා ජනතාවගේ ක්‍රය ශක්තිය බලපාන අතර ව්‍යාපාර කටයුතු සඳහා දැරීමට සිදු වන පිරිවැය ද ආර්ථික සාධක මත රඳාපවතී.

නිදසුන් :- මිල උද්ධමනය, පොළී අනුපාතය, දළ ජාතික නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ජීවන වියදම, ආදායම බෙදීයාමේ විෂමතාව, ඉතිරිකිරීම්, ආයෝජන

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඉන් ඇති වන අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර කටයුතු කළ යුතුය.

අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සමාජ හා සංස්කෘතික පරිසරය

පුද්ගලියන් තුළ ඇති විශ්වාස, සමාජ සාරධර්ම යනාදිය සමාජ හා සංස්කෘතික පරිසරය තුළ අන්තර්ගත වේ.

නිදසුන් :- පුද්ගලයින් තුළ පවත්නා විශ්වාස
පුද්ගලයින් තුළ පවත්නා වටිනාකම්
සිරිත් විරිත්
සිතුම් පැතුම්
ආගමික විශ්වාස

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඒවාට අනුගත වෙමින් ව්‍යාපාර කර ගෙන යාමට සිදු වේ.

## තාක්ෂණික පරිසරය

සන්නිවේදන තාක්ෂණයේ ප්‍රවණතා සහ කෘෂිකාර්මික, කාර්මික. වෛද්‍ය හා අනෙකුත් ක්ෂේත්‍රවල සිදු වී ඇති තාක්ෂණික වෙනස්කම් තාක්ෂණික පරිසරයට අයත් වේ .

නිදසුන් :- නව තාක්ෂණික සොයා ගැනීම්.
තාක්ෂණය සීග්‍රයෙන් වෙනස් වීම.
සන්න්ිවේදන තාක්ෂණයේ වෙනස් වීම්.
භාණ්ඩ යල් පැනීම.

තාක්ෂණික පරිසරයේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතුය.

## ප්‍රජා පරිසරය

ව්‍යාපාර සමඟ සම්බන්ධ වන ප්‍රධාන ම සාධකය ජනගහනයයි. එනම් වෙළෙඳපොළ සමන්විත වන්නේ පුද්ගලයන්ගෙනි.

| | | | |
|---|---|---|---|
| නිදසුන් | :- | ජනගහනයේ ප්‍රමාණය | ජනවාර්ගික මිශ්‍රය |
| | | ජනගහන වර්ධන අනුපාතය | අධ්‍යාපන මට්ටම් |
| | | ස්ත්‍රී/ පුරුෂභාවය | පවුලේ සංයුතිය |
| | | වයස් ව්‍යුහය | ගෘහ රටාව |

ප්‍රජා පරිසරය ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ කළ යුතුය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ස්වභාවික පරිසරය

ස්වභාවික සම්පත්වලට සිදුවන හානිදායක තත්ත්ව ගැන අද ගෝලීය වශයෙන් අවධානය යොමු වෙමින් පවතී. ලොවේ බොහෝ රටවල ව්‍යාපාර කටයුතු නිසා වාතයල ජලය හා පස දූෂණයට ලක් ව ඇත. ස්වභාවික පරිසරයේ යහපත් තත්ත්ව ඇති කරමින් ව්‍යාපාර කටයුතුවලට යොමු වීම පිළිබඳව නීතිරීති ද පනවා තිබේ.

ස්වභාවික පරිසරයේ ඇති වන වෙනස්කම් ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරයි.

නිදසුන් :- ස්වභාවික සම්පත් සොයා ගැනීම.

කාලගුණික හ දේශගුණික වෙනස්වීම්

භූමියේ පිහිටීම

ස්වභාවික විපත්

ස්වභාවික පරිසරයේ ඇති වන ව්‍යාපාරික අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාරිකයා උත්සාහ ගත යුතුය.

## ගෝලීය පරිසරය


ගෝලීයකරණය හේතුවෙන් රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරු වීමට වැඩි අවස්ථාවක් සැලසී තිබේ. එසේ ම පුද්ගලයින්ගේ සංස්කෘතිය ද වෙනසකට ලක් ව තිබේ. මේ නිසා විවිධ භාණ්ඩ හා සේවා ලෝක වෙළෙඳපොළට එක් වී ඇත. දැඩි තරඟකාරිත්වයක් ද දක්නට ලැබේ.

නිදසුන් වෙළෙඳ ගිවිසුම් ඇති වීම.

වෙළෙඳ හවුල් ඇති වීම.

ලෝක සංවිධාන බිහි වීම.

අන්තර්ජාතික වශයෙන් නීතිරීති ඇති කිරීම.



අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම නිදසුන් කිහිපයක් ඇසුරෙන් පහත පරිදි පැහැදිලි කල හැකිය.

- ප්‍රජා පරිසරය යටතේ ජනගහනය වී වීම නිසා භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම වැඩි වීමෙන් ව්‍යපාර වලට අවස්ථාව උදා වේ.
- එසේ ජනගහනය අඩු වීම නිසා භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම පහළ යාමෙන් ව්‍යපාර වලට තර්ජන මතු වේ.
- ආර්ථික පරිසරය යටතේ පොලී අනුපාතය අඩු වීම නිසා ණය ගැනීම වැඩි වීව්‍යාපාර අවස්ථා උදාවේ. එසේම පොලී අනුපාත වැඩි වීමෙන් ණය ගැනීම් සීමා වන අතර ව්‍යාපාර තර්ජනවලට මුහුණ දීමට සිදු වේ.
- දේශපාලන හා නෛතික පරිසරය යටතේ ව්‍යාපාරිකයින්ට හිතකර නීති රීති පැනවීමෙන් ව්‍යපාර අවස්ථා උදාවන අතර ව්‍යාපාරිකයින්ට අහිතකර නීති රීති පැනවීමෙන් ව්‍යපාර වලට තර්ජන වලට මුහුණ දීමට සිදු වේ.

බොහෝ විට සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි බලපෑම් ඇති කිරීම තුලින් ව්‍යපාර කෙරෙහි අවස්ථා හෝ තර්ජන මතු කරයි.

නිදසුන් ලෙස

- භාණ්ඩ හා සේවා වල මිල මට්ටම වැඩි වීම නිසා සැපයුම්කරුවන් සපයන ස භාණ්ඩ හා සේවා වල මිලද වැඩි වේ.
- එසේම වැටුප් මට්ටම වැඩි වීම නිසා ආසන්න පරිසර බලවේගයක් වන ගනුදෙනුකරුවන් (පාරිභෝගිකයින්) අදායම වැඩි වී භාණ්ඩ හා සේවා වලට ඇති ඉල්ලුම වැඩි වේ.





Copyright © www.e-thaksalawa.moe.gov.lk

එක් එක් සාර්ව පරිසර බලවේග අතර ද අන්තර් සම්බන්ධතාවයක් පවතින බව පහත නිදසුන්වලින් පැහැදිලි වේ.

- මැණික් ඉල්ලම් ස්භාවික පරිසරයට අයත් වේ. නමුත් එය ව්‍යාපාර කටයුත්තක් බවට පත් කිරීමේ දී නීතියේ අවසරය ලබා ගැනීමට අවශ්‍ය වේ.

- වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණික උපකරණයක් වන ටෙලර් යන්ත්‍රක් සවි කිරීමේදී මහා බැංකුවේ අවසරය ලබා ගැනීම අවශ්‍ය වේ.

මේ අනුව සාර්ව පරිසර බලවේග වෙන් වෙන්ව විස්තර කළද මේවා අතර අන්තර් සම්බන්ධතාවයක් පවතින බව පැහැදිලි වේ.

අන්තර්ගතය සැකසීම :- බස්නාහිර පළාත , සබරගමුව පළාත

පරිගණක පිටු සැකසීම :- T.M.G. දුලාන් සංජීව , නු/ ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

පුනරීක්ෂණ

1.1

I. ව්‍යාපාර යන්න අර්ථ දක්වන්න.
II. අවශ්‍යතා වුවමනා හා නිෂ්පාදිත යන පද හඳුන්වා ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න (2018 A/L)
III. පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබගේ අවශ්‍යතා ලැයිස්තුවක් හා ඊට අදාල වුවමනා දෙක බැගින් ද ඉදිරිපත් කරන්න.
IV. ව්‍යාපාරයක අරමුණු හතරක් ලැයිස්තුගත කරන්න. (2017 A/L)
V. ඔබගේ ප්‍රදේශයේ ඇති ව්‍යාපාරයක් උදාහරණයට ගෙන ව්‍යාපාර වල ගති ලක්ෂණ මොනවාදැයි ඒ ඇසුරෙන් දක්වන්න.
VI. රටක ආර්ථික වර්ධනය උදෙසා ව්‍යාපාර වල ඇති වැදගත්කම කරුණු 4 ක් ඇසුරෙන් දක්වන්න.

1.2

I. කාර්මික විප්ලවයේ ආර්ථික සමාජයීය හා පාරිසරික ප්‍රතිවිපාක 4 බැගින් දක්වන්නග
II. වර්තමාන ඩිජිටල්කරණය සමඟින් ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන නව ප්‍රවණතා 6ක් දක්වන්නග
III. නිෂ්පාදන ක්‍රමයල ඍජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරුවීමට බල පෑ ප්‍රධාන හේතු හතරක් දක්වන්න (2018 A/L)
IV. ව්‍යාපාර උපකාරක සේවා හතරක් සඳහන් කරන්න (2015 A/L)
V. කාර්මික විප්ලවය හේතු කොටගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න (2014 A/L)
VI. වාණිජ්‍ය හා ව්‍යාපාර අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න (2014 A/L)
VII. 'ව්‍යාපාර වල සංවර්ධනය වසරකින් දෙකකින් ඇති වූවක් නොව එය මිනිස් ශිෂ්ඨාචාරයට සමගාමිව සංවර්ධනය වූ ක්‍රියාදාමයකි'ග
VIII. ව්‍යාපාර විකාශනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය ගැන අදහස් දක්වන්න. (2011 A/L)

1.3

- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව දළ දේශිය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය එහි අගය වැඩි වන පිළිවෙළට දක්වන්න.

1.4

- නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක් උදාහරණයට ගෙන එහි ව්‍යාපාර ක්‍රියාවලිය රූප සටහනකින් දක්වන්න.

1.5

- ඖෂධ ශාලාවක් උදාහරණයට ගෙන ඒ කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් 6ක් සඳහන් කරන්න.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

1.6

- ව්‍යාපාර පරිසරය වර්ග කර දක්වන්න.
- ඔබගේ පාසල උදාහරණයට ගෙන එහි අභ්‍යන්තර පරිසරය තුළ ඇතුළත් සාධක මොනවාදැයි දක්වන්න.
- ගෝලීයව උද්ගතව ඇති කොරෝනා වසංගත තත්ත්වය ව්‍යාපාර වලට කෙසේ බලපෑම් කරන්නේ දැයි ව්‍යාපාර පරිසර සාධක ඇසුරෙන් විශ්ලේෂණය කර පෙන්වන්න.

1.7

- ඔබගේ පාසලේ අභ්‍යන්තර බලවේග 4ක් දක්වා ඒ එක් එක් පරිසර බලවේගය හා බැඳුණු ශක්තීන් හා දුර්වලතා 2 බැගින් දක්වන්න.

1.8

- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ආසන්න පරිසර බලවේග ලැයිස්තුගත කර එම බලවේග ව්‍යාපාර වලට ඇති කරන බලපෑම වෙන වෙනම දක්වන්න.

1.9

- ව්‍යාපාර සාර්ව පරිසර අතර අන්තර් සම්බන්ධතාවයක් පවතින බව උදාහරණයක් ඇසුරෙන් දක්වන්න.



Copyright © www.e-thaksalawa.moe.gov.lk